“ඔබේ දෙමව්පියන් මත ඔබ දිවුරා පැවසීම සැබැවින්ම අල්ලාහ් ඔබට තහනම් කර ඇත්තේය

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව උමර් ඉබ්නු අල් කත්තාබ් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “ඔබේ දෙමව්පියන් මත
ඔබ දිවුරා පැවසීම සැබැවින්ම අල්ලාහ් ඔබට තහනම් කර ඇත්තේය.” උමර් තුමා: අල්ලාහ් මත දිවුරා පවසමි. අල්ලාහ්ගේ දූතයාණන් එය වළක්වා ඇති බවට මාගේ කණට වැකුණු දා පටන්
මෙනෙහි කිරීමක හෝ (වෙනත් කෙනෙකුගේ ප්රකාශයක්) දැනුම් දීමක මම එසේ දිවුරා නොසිටියෙමි.”
[صحيح] [متفق عليه]

තම දෙමාපියන් මුතුන් මිත්තන් කෙරෙහි දිවුරා පැවසීම අල්ලාහ් තහනම් කර ඇති බව නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් දන්වා සිටියහ. එහෙයින් කවරෙකු දිවුරන්නට සිතන්නේ ද ඔහු අල්ලාහ් කෙරෙහි පමණක් දිවුරා සිටිය යුතුය. ඔහු හැර වෙනත් කිසිවෙකු මත දිවුරා නො සිටිය යුතුය. අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) එය තහනම් කර ඇති බව තමන් සවන් දුන් දා පටන්, එසේ තමන් විසින්ම හෝ තවත් කෙනෙකු පිළිබඳ පවසන විට හෝ එසේ කිසිදා දිවුරා නොසිටි බවත් අල්ලාහ් හැර වෙනත් කිසිවෙකු කෙරෙහි දිවුරා නොසිටි බවත් උමර් ඉබ්නු කත්තාබ් (රළියල්ලාහු අන්හු) තුමා මෙනෙහි කර සිටියේය.

https://sunnah.global/hadeeth/si/show/2945